**ශීර්ෂය - 433 ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 24 වන දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) 2022 ජනවාරි 12 දිනැති අංක එස්ජ්/එම්ජ්ජ්/02/01/01 දරන රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වල ‘‘වාර්තා කිරීමේ පදනම’’ සංශෝධනය කර තිබුණ ද, අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන වලින් එය හෙළිදරව් නොකර ඉකුත් වර්ෂයේ සංඛ්‍යා සංශෝධනය පමණක් සිදුකර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළබඳව මා විසින් කර තිබූ නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය වූ මුදල් ප්‍රවාහය යටතේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම වෙනුවෙන් රු. 60,462,651 ක් හඳුනාගෙන තිබුණද, විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව එය රු. 518,315,186 ක් වූයෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය වූ මුදල් ප්‍රවාහය රු. 457,852,534 ක් අඩුවෙන් දක්වා තිබුණි. | පුද්ගල හැකියා වර්ධන වියදම් සහ ව්‍යාපෘති වැඩිදියුණු කිරීමේ හෝ පුළුල් කිරීමේ වියදම් ආයෝජන ලෙස සලකනු ලැබේ. | රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ වූ අත්තිකාරම් අයකර ගැනීම රු. 270,114 ක් ලෙස හඳුනාගෙන තිබුණ ද, විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ දී රු.463,564 ක අත්තිකාරම් අයකර ගැනීම් සිදුකොට තිබූයෙන් රු. 193,450 ක වෙනසක් නිරීක්ෂණය විය. | 433-011 වැය ශීර්ෂය යටතේ සිදු කළ අත්තිකාරම් පියවීම රු.270,114 වන අතර 433-012 වැය ශීර්ෂය යටතේ සිදුකල පවරාගැනීම් රු.193,450 වේ. | - එම - |
| (ඇ) | මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැයකරන ලද මුදල් ප්‍රවාහය යටතේ අත්තිකාරම් ගෙවීම් ලෙස රු. 472,365 ක් හඳුනාගෙන තිබුණ ද, විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එය රු. 665,815 ක් වූයෙන් අත්තිකාරම් ගෙවීම් වටිනාකම රු. 193,450 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 433-011 යටතේ සිදු කල අත්තිකාරම් ගෙවීම් රු.472,365 වන අතර රු.193,450 යනු 433-012 යටතේ පවරා ගැනීම්ය. | - එම - |
| (ඈ) | ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය යටතේ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් සඳහා රු. 461,002,147 ක් වැයකර ඇති බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යාංශය විසින් මිල දී ගත් භෞතික වත්කම් වටිනාකම රු.3,149,612 ක් පමණක් වූයෙන් රු.457,852,535 ක වෙනසක් නිරීක්ෂණය විය. | විගනණයේ දක්වා ඇත්තේ වත්කම් අත්පත් කර ගැනීමට අදාල වටිනාකම් වුව ද මුදල් ප්‍රවාහයට අනුව පෙන්නුම් කරන වටිනාකම තුළ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් පමණක් නොව වෙනත් ආයෝජන අත්කර ගැනීම් ද ඇතුළත් වේ. | - එම - |

**1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) ඉන්වෙන්ට්‍රි ලේඛනය** | | |
| මු.රෙ. 454 (1) ප්‍රකාරව ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. | මේ වන විට ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර ඇත. | මු.රෙ. 454 (1) ප්‍රකාරව ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම. |
| **(ආ) වාහන අනතුරු ලේඛනය** | | |
| අනතුරු ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. | යාවත්කාලීන කර ඇත. | වාහන අනතුරු ලේඛනය යාවත්කාලීන කළ යුතු වීම. |
| **(ඇ) වාහන ලොග් සටහන් ලේඛන** | | |
| මු.රෙ. 1645 (අ) ප්‍රකාරව වාහන පිළිබඳ විස්තර, දැවෙන ඉන්ධන ප්‍රමාණය, වාහන බලපත්‍ර විස්තර, වාහනයේ භාරකාරීත්වය, මාරු කිරීම පිළිබඳ විස්තර හා වාහන නඩත්තු හා අලුත්වැඩියා සම්බන්ධ විස්තර යනාදී ඇතුළත් කළ යුතු සියළුම තොරතුරු ඇතුළත් කරමින් වාහන ලොග් සටහන් පොත් නඩත්තු කර නොතිබුණි. | ජල සම්පාදන අමාත්‍යාංශය සතු වාහන මෙම අමාත්‍යාංශයේ පරිහරණය සඳහා පමණක් ලබාදී ඇත. ලබාදුන් දින සිට අදාල කරුණු ලොග් පොතේ සටහන් කර ඇත. | මු.රෙ. 1645 (අ) ප්‍රකාරව වාහන ලොග් සටහන් ලේඛන යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 433-1-2-0-1403 හා 433-1-2-0-1703 යන පුනරාවර්තන වැය විෂය දෙක යටතේ වූ වටිනාකම රු. 115,000 ක ශුද්ධ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | මෙම අමාත්‍යාංශය පිහිටා ඇත්තේ ජල සම්පාදන අමාත්‍යාංශය පිහිටා ඇති ගොඩනැගිල්ලේ වන බැවින් ද, කොවඩ් 19 වසංගතය හේතුවෙන් අපේක්ෂිත වැඩසටහන් නොපැවැත්වීම හේතුවෙන් ද මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | මු.රෙ. 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සඳහා වූ රු. 1,975,000 ක ප්‍රතිපාදන මු.රෙ. 66 යටතේ සම්පූර්ණයෙන්ම වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. | නිල ඇඳුම් දීමනා සඳහා ඉල්ලීම් ඉදිරිපත් නොවීම, කාර්යාල කාර්ය සහයක නිලධාරී පුරප්පාඩු සම්පූර්ණ නොවීම, පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් යන්ත්‍රෝපකරණ උපයෝජනය සීමා වීම යනාදිය නිසා අපේක්ෂිත පරිදි වියදම් ඇති නොවීය. | -එම- |
| (ඇ) | පුනරාවර්තන වැය විෂයය 13 ක් සඳහා වූ රු. මිලියන 14.2 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් සියයට 30 සිට සියයට 97 දක්වා වූ පරාසයක ප්‍රතිපාදන මු.රෙ 66 මගින් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. | අපේක්ෂිත වියදම් පැන නොනැගීම නිසා අමාත්‍යාංශයේ අවශ්‍යතාව පරිදි වෙනත් වැය විෂයන්ට මාරු කරන ලදී. | -එම- |
| (ඈ) | පුනරාවර්තන වැය විෂයයන් දෙකක් යටතේ ලද රු. 305,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ට වඩා වැඩි ප්‍රමාණයක් ඉතිරිකර තිබුණි. | මෙම අමාත්‍යාංශය ජල සම්පාදන අමාත්‍යාංශයේ පිහිටා ඇති ගොඩනැගිල්ල තුළ පිහිටා ඇති බැවින් ද දේපල ණය ඉල්ලුම් නොකිරීම හේතුවෙන් ද මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | -එම- |
| (ඉ) | මූලධන වැය විෂයය 03 ක රු.1,150,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරිකර තිබුණි. | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් යන්ත්‍ර සහ උපකරණ භාවිතය අඩු වීම නිසා නඩත්තු වියදම් ඇති නොවීම, SACOSAN කාර්යාලය ක්‍රියාත්මක නොවීම මෙම ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු වී ඇත. | -එම- |
| (ඊ) | මූලධන වැය විෂයය 11 ක් සඳහා ලද රු.මිලියන 1,331.4 ක ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 77 දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. | අපේක්ෂිත පරිදි පුහුණු වැඩසටහන් නොපැවැත්වීම, බිල්පත් පියවීමට අක්මුදල් නොලැබීම, කොවිඩ් වසංගතය හේතුවෙන් රට වසා තැබීම, වෙළඳපලේ ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟවීම යනාදිය හේතුවෙන් ප්‍රතිපාදනයන් ඉතිරි වී තිබේ. | -එම- |

## 2.2 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය අමාත්‍යවරයාගේ රාජකාරී කටයුතු සඳහා අමාත්‍යාංශයෙන් ලබා දී තිබූ රථය අනතුරකට භාජනය වීම හේතුකොට ගෙන 2021 මැයි 12 සිට 2021 සැප්තැම්බර් 14 දක්වා රු.2,836,523 ක මුදලක් වියදම් කරමින් කුලී පදනම මත වාහනයක් පුද්ගලික ආයතනයකින් ලබාගෙන තිබුණි. මෙම වියදම හේතුකොට ගෙන 433-01-01-1401 වැය විෂය සියයට 218.64 කින් ඉක්මවා තිබුණි. තව ද, උක්ත කුලී වාහනය භාවිතය වෙනුවෙන් 2021 මැයි 12 සිට 2021 ජුනි 10 දිනය දක්වා පමණක් පුද්ගලික ආයතනය සමඟ ගිවිසුම් ගතවී තිබුණ ද, 2021 සැප්තැම්බර් 14 දක්වාම ගිවිසුමකින් තොරව මාස 03 ක කාල සීමාවක් වෙනුවෙන් රු.1,665,598 ක් ගෙවීම් කර තිබුණි. තව ද, වාහනය සඳහා මාසිකව කුලී ගෙවීමේ දී ධාවනය කර තිබූ දුර මයිලෝ මීටරය මගින් දෛනිකව තහවුරු කර ගැනීමකින් තොරව වාහන සැපයුම්කරු ඉදිරිපත් කළ බිල්පත් මත පමණක් පදනම්ව කි.මී.17,986 ක් වෙනුවෙන් ඉහත රු.2,836,523 ක මුදලක් ගෙවා තිබීම රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ රෙගුලාසි 138 හා 139 ට පටහැනි බව නිරීක්ෂණය විය. | දීර්ඝ කරන ලද ගිවිසුම ඉදිරිපත් කරමි. ගරු රාජ්‍ය අමාත්‍යතුමන්ගේ පෞද්ගලික ලේකම් විසින් බිල්පත් සනාථ කර නිර්දේශ කිරීමෙන් අනතුරුව ගෙවීම් සිදු කර ඇත. | ගෙවීම් කිරීමේ දී මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 උපවගන්තිය | අමාත්‍යාංශයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. | ජාතික විගණන පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 104 | 2021 අප්‍රේල් 04 වන දින අනතුරට ලක් වූ අංක KK-5237 දරන වාහනයට අදාලව අලාභ හානි නිශ්චය කොට අවසන් වාර්තාව ඉදිරිපත් කිරීම 2022 මාර්තු 31 දින වන විටත් සිදුකර නොතිබූ අතර ඒ වෙනුවෙන් අමාත්‍යාංශය විසින් දරන ලද රු. 135,085 ක මුදල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාහනය සම්බන්ධ පරීක්ෂණ නිර්දේශ ලබා දී ඇති අතර ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| | (ii) මුදල් රෙගුලාසි 371 (ඇ) | 2021 ජනවාරි සිට 2021 සැප්තැම්බර් දක්වා අවස්ථා 10 ක දී විවිධ කාර්යයන් සඳහා නිකුත් කළ රු.224,020 ක් වූ තත්කාර්යය අතුරු අග්‍රිම අදාල කාර්යය අවසන් වූ වහාම නිරවුල් කර නොතිබුණි. තව ද, අමාත්‍යාංශ නිලධාරීන් තිදෙනෙකුට කලින් ලබාදුන් අත්තිකාරම් මුදල් පියවීමට පෙර නැවත අත්තිකාරම් මුදල් ලබා දී තිබුණි. | ඉදිරියේ දී මෙවන් ප්‍රමාදයන් නොවීමට වගබලාගන්නා ලෙස නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1. ඡේදය | අමාත්‍යාංශයේ වාහන සඳහා ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. | සංචිතය සඳහා ඇති වාහන වල ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇත . | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6. ඡේදය. | 2021 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2021 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුව ද, 2021 මාර්තු 31 දින වන විටත් එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණය මේ වන විට නියමිත දිනට සිදුකර ඇති බව සඳහන් කරමි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 සැලැසුම් කිරීම**

-----------------

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2021 වර්ෂය සඳහා අමාත්‍යාංශය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කොට තිබුණ ද, එම චක්‍රලේඛයේ ඡේද අංක 3 ප්‍රකාරව ඇතුළත් විය යුතු සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක් මුදල් අවශ්‍යතා සැලැස්ම, සැලසුම් කර ඇති ප්‍රධාන සංවර්ධන වැඩ සටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම යන කරුණු ඒ තුළ අන්තර්ගතව නොතිබුණි. | 2023 වර්ෂයේ සිට රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලස්ම සකස් කරන බව දැනුම් දෙමි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රතිපාදනයන්ට අනුව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වීම. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ දී රු.මිලියන 775 ක ප්‍රතිපාදන වෙන්කර ගනිමින් අමාත්‍යාංශය යටතේ ව්‍යාපෘති එකක් ද, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව යටතේ ව්‍යාපෘති හතරක් ද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යටතේ ව්‍යාපෘති තුනක් ද, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා ව්‍යාපෘති දෙකක්ද, ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. ඒ අතරින් රු. මිලියන 61.21 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ මඩුපල්ලි ජල සම්පාදන ව්‍යාපෘතියට හා ග්‍රාමීය ජල සැපයුම් හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට අදාල ක්‍රියාකාරකම් 10 ක් සම්බන්ධයෙන් කිසිඳු භෞතික ප්‍රගතියක් ලබාගෙන නොතිබුණි. | මඩුපල්ලි ජල සම්පාදන ව්‍යාපෘතිය සැමට ජලය වැඩසටන යටතේ ඇතුළත් කිරීම හේතුවෙන් එහි ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | වර්ෂය ආරම්භයේ දී සැලසුම් කළ පරිදි අදාල ව්‍යාපෘති ප්‍රගතිය කරා ළඟා වීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබූ හා රු. මිලියන 191.93 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ ජල පෝෂක සංරක්ෂණ වැඩසටහන, ග්‍රාමීය ජල සැපයුම් හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, වකුගඩු රෝග නිවාරණ වැඩසටහන යන ව්‍යාපෘති 03 ට අදාල ක්‍රියාකාරකම් 20 ක් වර්ෂය තුළ නිම කිරීමට සැලසුම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ඒවා නිම නොකර පැවතුණි. | පැවති කොවිඩ් වසංගතය, ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟය, අයහපත් කාලගුණය සහ ජල නල සැපයීමට නොහැකිවීම යනාදී කරුණු හේතුකොට ගෙන අනෙකුත් ව්‍යාපෘතිවල අපේක්ෂිත ප්‍රගතිය ලබා ගැනීමට නොහැකි විය. | - එම - |

## 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර තිබූ වැසි ජල ටැංකි ඉදිකිරීමේ වැඩ සටහනේ මූලික අරමුණ වනුයේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජල නල පද්ධතිය මගින් ජලය ලබා දීමට නොහැකි ග්‍රාමීය හා දුෂ්කර ප්‍රදේශවල ජනතාවට සුරක්ෂිත පානීය ජලය ලබා දීම වුව ද, විධිමත් ක්‍රමවේදයක් මත ප්‍රතිලාභීන් තෝරා නොගැනීම හේතුවෙන් ප්‍රතිලාභ අත්‍යවශ්‍ය පුද්ගලයන්ට එය ලබා දී නොතිබූ බවත් ටැංකි සඳහා රැස්වන ජලය පානය සඳහා සුදුසු තත්ත්වයට පත් කිරීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බවත් පුත්තලම දිස්ත්‍රික්කය තුළ ඉදිකරන ලද වැසි ජල ටැංකි නියැදියක් සඳහා සිදු කළ භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. | අදාල ව්‍යාපෘතිය හෝ ප්‍රතිලාභීන් නිර්නායකයන් අනුව තෝරාගැනීම දෙපාර්තමේන්තුවට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගේ හා ස්ථාන භාර නිලධාරීන්ගේ වගකීම වන අතර ඒ අනුව ප්‍රතිලාභී ලේඛන සකස් කර ඇත. විධිමත් ලෙස නඩත්තු නොවන පද්ධතින් සඳහා සංවර්ධන නිලධාරීන් මූලික වී සරල පෙරහන් පද්ධතියක් සකස් කළ ද එය විධිමත් පරිදි සකස් කිරීම පිළිබඳව කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | අපේක්ෂිත ප්‍රතිලාභීන් ක්‍රමානුකූල පදනමක් මත හඳුනා ගැනීමටත් පානීය ජලයේ සුරක්ෂිතතාවය තහවුරු කිරීමටත් කටයුතු කළ යුතු වීම. |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 හා 2017 වර්ෂයන්වල දී වැඩ ආරම්භකර තිබූ හා රාජ්‍ය අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදුකරනු ලබන තිස්සමහාරාම ජල සම්පාදන ව්‍යාපෘතිය, ත්‍රිකුණාමලය ජල සම්පාදන ව්‍යාපෘතිය, කෑගල්ල දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කිරීමේ ගම්මාන සඳහා ජල පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය සහ අන්දරගස්යාය ජල සම්පාදන යෝජනා ක්‍රමය යන ව්‍යාපෘතීන් ඉටු කිරීමේ සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයටත් එම ව්‍යාපෘති නිම කිරීමට අපොහොසත්ව පැවතුනි. | අදහස් දක්වා නොතිබුණි. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති නිම කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම හා ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් සෘජු අධීක්ෂණයක් සිදු කල යුතු වීම. |

### 3.5 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුලත වාර්ෂික කාර්ය සාධන වාර්තාව සභාගත කළ යුතු වන අතර භාණ්ඩාගාර ලේකම්ගේ අංක පීඑෆ්ඩී/ආර්ඊඩී/ආර්ඊජී/02/සීසී/01/2021 දරන හා 2021 මැයි 12 දිනැති ලිපිය අනුව 2020 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව 2021 ජුනි 30 දිනට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුව පැවතුණි. එසේ වුව ද, රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2021 ජූලි 16 දින බව විගණනයේ දී නිරීක්ෂණය විය. | පැවති කොරෝනා වසංගතය හමුවේ මෙය සකස් කර භාෂා ත්‍රිත්වයටම පරිවර්තනය කර 2021 ජූලි 16 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ හා භාණ්ඩාගාර ලේකම්ගේ නිර්දේශ අනුව වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වීම. |

### 3.6 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 (අ) (ආ) (ඇ) හා (ඇ) ඡේද ප්‍රකාරව සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම, මිල දී ගැනීමේ දී අදාල ලියාපදිංචි සැපයුම්කරුවන්ට පමණක් සීමා වීම හා සැපයුම්කරුවන්ගේ ලියාපදිංචි ලැයිස්තුව අවම වශයෙන් වසරකට එක් වරක්වත් යාවත්කාලීන කිරීම සිදු කළ යුතුව තිබුණ ද, රාජ්‍ය අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2021 වසරේ දී සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට නොහැකි වූ නමුත් 2022 වසර සඳහා මේ වන විට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සිදුකර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 3.7 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන 12 ක් අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුල පරිහරණය කර තිබුණි. | මෙම අමාත්‍යාංශයට වාහන නොමැති අතර ජල සම්පාදන අමාත්‍යාංශයෙන් පරිහරණය සඳහා පමණක් ලබා දෙන ලද වාහන පරිහරණය කරන ලදී. | වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන පරිහරණය කිරීමේදී ඒවා විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.8 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය අමාත්‍යාංශ මාධ්‍ය ඒකකය විසින් කලින් සැලසුම් කළ වැඩසටහනකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් සහ වරින්වර සිදු කරනු ලබන ඉල්ලීම් මත පවතින වාහන කළමනාකරණය කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් අමාත්‍යාංශ මාධ්‍ය ඒකකයේ කාර්යයන් සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව කුලී පදනම මත වාහන ලබා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.216,893 ක වියදමක් දරා තිබුණි. | අමාත්‍යාංශයේ සංචිත වාහන නොමැති අවස්ථාවල දී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සහිතව ලේකම්ගේ අනුමැතිය පරිදි කුලී පදනම මත වාහනයක් ලබා ගත් අතර මේ සම්බන්ධව පූර්ණ සැලසුමකට අනුව කටයුතු කරන මෙන් පෞද්ගලික හා මාධ්‍ය ලේකම්වරු දැනුවත් කර ඇත. | විධිමත් හා විනිවිද භාවයකින් යුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුළින් කුලී වාහන ලබාගැනීමට කටයුතු කළයුතු වීම. |
| (ආ) | අමාත්‍ය කාර්ය මණ්ඩල නිලධාරීන් හට සංයුක්ත දීමනා හා අතිකාල දීමනා ලබා දීමේ දී එකම වාහනය එකම කාල පරිච්ඡේදය තුළ භාවිතා කළ බවට ඉදිරිපත් කළ වවුචර සඳහා අතිකාල හා සංයුක්ත දීමනා ලෙස රු. 351,848 ක් ගෙවා තිබුණි. | ඉදිරිපත් කර ඇති වවුචර්පත් නිවැරදි අතර අනෙක් වවුචර්වල වාහන අංක වැරදීමකින් සටහන්ව තිබූ හෙයින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිවැරදි කරන ලදී. | වියදම් අනුමත කිරීම සහතික කිරීම හා ගෙවීම් කිරීමේ දී ඒවායේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමෙන් පසු පමණක් ගෙවීම් සිදුකළ යුතු වීම. |

## 3.9 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලයේ රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදල් වෙනුවෙන් සේවකයින්ගෙන් හා ආයතනයෙන් අයකර ගන්නා මුදල් නොපමාව අදාල ආයතනය වෙත යැවිය යුතු වුව ද 2020 වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් දක්වා හා 2021 ජනවාරි සිට ජූනි දක්වා වූ කාල පරිච්ඡේදයන් සඳහා වන රු.1,230,265 ක රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල් ප්‍රේෂණය කිරීමේ දී සැලකිය යුතු ප්‍රමාදයන් සිදුව තිබුණි. | පැවති කොවිඩ් තත්ත්වය මීට හේතු වූ අතර වර්තමානයේ දී වැටුප් අවකරණ සමඟ රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදල වෙනුවෙන් චෙක්පත් යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. | රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදල් වෙනුවෙන් සේවකයින්ගෙන් හා ආයතනයෙන් අයකර ගන්නා මුදල් නොපමාව අදාල ආයතනය වෙත යැවීමට කටයුතු කළ යුතු වීම. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධනය වෙනුවෙන් අරමුණු 05 ක් හඳුනාගෙන තිබූ අතර එකී අරමුණු ළඟාකර ගැනීම සඳහා ප්‍රධාන කාර්ය සාධක දර්ශක 09 ක් හඳුනාගෙන තිබුණි. කෙසේ වුව ද, එසේ හඳුනාගත් කාර්ය සාධක දර්ශක එකක පමණක් ඉලක්කයන් හඳුනාගෙන ඊට අදාල ප්‍රගතිය වාර්තාකර තිබුණි. | රාජ්‍ය අමාත්‍යාංශය නිල වශයෙන් ක්‍රියාත්මක වූයේ 2020 සැප්තැම්බර් 07 දිනෙන් පසුව බැවින් වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සඳහා ආරම්භයේ දී නිශ්චිත ඉලක්කයන් ලබා දීමට නොහැකි විය. | තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට අදාල ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| (ආ) | තිරසර සංවර්ධනය අරමුණු සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් වැඩමුළු කිසිවක් සමාලෝචිත වර්ෂය තුළ පවත්වා නොතිබුණි. | අමාත්‍යාංශ නිලධාරීන් අනුයුක්ත කිරීම 2020 සැප්තැම්බර් 16 වන දින සිට සිදු කළ බැවින් ද එවකට රට තුළ පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් ද වැඩමුළු සිදු කිරීමට නොහැකි විය. | - එම - |
| (ඇ) | 2018 අප්‍රේල් 27 දිනැති අංක එම්.එස්.ඩී.ඩබ්/8/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට සම්බන්ධීකරණ කටයුතු සඳහා නිලධාරීන් දෙදෙනෙකු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නම්කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට තිරසර සංවර්ධන අරමුණු හා ඒ හා සම්බන්ධ කාර්යයන් සිදුකර ගෙන යාම සඳහා සැලසුම් කරනු ලැබීය. | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 5. යහ පාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනත් 40(1) වන වගන්තිය ප්‍රකාරව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ රෙගුලාසි අංක 128(අ,ආ) සහ 133 ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ රාජකාරි හා වගකීම ඉටුකිරීමේ දී ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා අභ්‍යන්තර විගණන | අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීම සඳහා අභ්‍යන්තර විගණක තනතුර සඳහා සුදුසු මාණ්ඩලික නිලධාරියෙකු ඉල්ලා සිටිය ද මෙතෙක් ලැබී නොමැත. සංවර්ධන නිලධාරියෙකු අනුයුක්ත කර ඇත. | ජාතික විගණන පනතේ හා මුදල් රෙගුලාසි සංග්‍රහයේ ප්‍රතිපාදන අනුව කටයුතු කළ යුතු වීම. |

අංශයක් පිහිටුවිය යුතු අතර, ජාතික විගණන පනතේ 41 වගන්තියෙහි ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නිසි පරිදි පැවැත්විය යුතුය. කෙසේ වුව ද, රාජ්‍ය අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත කර තිබුණ ද, එම තනතුරට අදාල බඳවාගැනීම් සිදුකර ගනිමින් අමාත්‍යාංශයේ කාර්යසාධනය සහ ඵලදායිතාවය ඉහළ මට්ටමක පවත්වාගෙන යාම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට හා එය ක්‍රියාකාරී ලෙස පවත්වාගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි.

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සෑම සේවක කාණ්ඩයක් යටතේම අනුමත සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට 50 සිට සියයට 100 දක්වා වූ ඉහළ පරාසයක් ගන්නා බව නිරීක්ෂණය විය. එය අනුමත මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 64 ක් වැනි ඉහළ අගයක් ගෙන තිබුණි. | පුරප්පාඩු පිරවීම සඳහා කැබිනට් අමාත්‍යාංශයෙන්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් සහ බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවෙන් ද අවස්ථා කිහිපයක දී ඉල්ලුම් කර ඇත. නමුත් එම තනතුරුවලට නිලධාරීන් ලබා ගැනීමට නොහැකි වී ඇත. | පුරප්පාඩු කඩිනමින් පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය අමාත්‍යාංශ අවශ්‍යතාවය මත සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අධ්‍යක්ෂ ඉංජිනේරු, ගණකාධිකාරී, අභ්‍යන්තර විගණක, සහකාර ලේකම් හා ඉංජිනේරු යනාදී ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සඳහා නිලධාරීන් 07 දෙනෙකු අනුමත කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානයටත් එම නිලධාරීන් බඳවාගෙන නොතිබුණි. | පුරප්පාඩු පිරවීම සඳහා ලිඛිත ඉල්ලීම් කළ ද ඒවා සම්පූර්ණ නොකරන ලදී. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ රියදුරු තනතුරු දෙකක් පුරප්පාඩුව පැවතිය දී රාජ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තිදෙනෙකු වෙනුවෙන් ජල සම්පාදන මණ්ඩලයේ සේවකයන් තිදෙනෙකු රියදුරු තනතුරේ රාජකාරී සඳහා යොදවාගෙන තිබූ අතර ඔවුන් සඳහා 2021 වර්ෂය වෙනුවෙන් වැටුප්, දීමනා හා අතිකාල ලෙස රු. 4,314,146 ක වියදමක් මණ්ඩලය විසින් දරා තිබුණි. තව ද, මෙලෙස බඳවාගෙන තිබූ එක් පුද්ගලයෙකු රියදුරෙකු වශයෙන් නොව කම්කරුවෙකු ලෙස මණ්ඩලයේ සේවයට බඳවාගෙන තිබූ බව නිරීක්ෂණය විය. | ජල සම්පාදන අමාත්‍යාංශයෙන් වාහන සමඟ ලබා දෙන ලද නිලධාරීන් මේ වන විට අදාල රාජකාරී කටයුතු ඉටුකරනු ලැබේ. | වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත් අදාල ආයතන වෙත නැවත නිදහස් කළයුතු වීම. |